18

# බුදු බණ වැනූ විදුසක්විතීන්

කතංගමුවේ රාහුල හිමි

භක්ති වර්ණනා මාර්ගයට අනුගත වෙමින් රචිත බුත්සරණ ජනතාවගේ බොදු බැතිය වර්ධනය කරවීමෙහිලා අතිශයින් උපකාරී වී ඇත. රතනත්‍රය කෙරෙහි කතුවරයා තුළ තිබූ අපරිමිත ශ්‍රද්ධාව පාඨකයා තුළ ජනිත කරවීමෙහිලා කතුවරයා ඉමහත් පරිශ්‍රමයක් දරා ඇති බව ග්‍රන්ථ පරිශීලනයෙන් අවබෝධ කර ගැනීමට පුළුවන. විශේෂයෙන් බුදුන් වහන්සේගේ රූපකාය හා ධර්මකාය පිළිබඳවද කතුවරයා වර්ණනා කරන්නේ ඉමහත් ගෞරවයෙන් හා භක්තියෙනි. බුදු ගුණ ගායනයට බට කතුවරයා සියලු බුදු ගුණයන්ම තෝරා ගත්තේ එබැවිනි. බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි විශිෂ්ටත්වය හා ශ්‍රේෂ්ඨත්වය වර්ණනා කරන කතුවරයා එම වර්ණනා මාර්ගයෙන් පාඨකයා තුළ ශ්‍රද්ධා භක්තිය ජනිත කරවීමට ගෙන ඇති උත්සාහය ප්‍රශස්තය. ධර්ම දේශකයෙකුගේ මුවින් පිටවෙන සුමධුර දේශනාවක් තරම් ඒ වර්ණනා රීතිය භක්ති ජනනයෙහිලා සාතිශයෝපකාරීය.

බුත්සරණ සංස්කරණය කළ ලබුගම ලංකානන්ද හිමිපාණෝ එහි පරිච්ඡේද වශයෙන් සොළොසක් ගෙනහැර දක්වති. එම පරිච්ඡේද සොළොසින් ප්‍රකීර්ණක වූ පළමු පරිච්ඡේදය ත්‍රිපිටකයේ නොයෙක් තැනින් උපුටාගත් ජාතක කථා දහනවයක පමණ සාරාංශය ගෙනහැර දක්වා ඇත.ඉන් පසුව විස්තර කෙරෙන පරිච්ඡේද තුළ එනම්, "අරහං" "සම්මා සම්බුද්ධෝ" "විජ්ජාචරණ සම්පන්නෝ" "සුගතෝ" "ලෝකවිදූ" "අනුත්තරෝ " "සත්ථා දෙවමනුස්සානම්" "බුද්ධෝ" "දේශනා විලාශය" "ධර්මකාය සම්පත්තිය" විශේෂයෙන්ම බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි විශේෂත්වය හා ශ්‍රේෂ්ඨත්වය දක්වයි. උපමා පරිච්ඡේදයේදීත් ලත් සෑම අවස්ථාවකදීම කතුවරයා බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියේ උදාරත්වය වර්ණනාවට හසුකර ගනී. මෙම පරිච්ඡේද තුළ බුදුන් වහන්සේගේ උතුම් ධර්මකාය සම්පත්තියෙහි තරම වර්ණනා කරන ඇතැම් තැනකදී කතුවරයා තමාගේ ධර්ම ඥානය ප්‍රකට කරවීමට ද අවස්ථාව යොදා ගෙන ඇත. මේ වර්ණනාවන් දෙස විමසිලිමත් වූ පශ්චාත් කාලීන ඇතැම් විචාරකයන් විද්‍යාචක්‍රවර්තීන්ගේ තත් වැනුම් මාර්ගයට ප්‍රශංසා කළා පමණක් නොව දොස් නැගූ තැන් ද දැක ගැනීමට පුළුවන.

"ග්‍රන්ථාරම්භයෙහි දැක්වෙන්නේ ප්‍රකීර්ණක කාණ්ඩයයි. විද්‍යාචක්‍රවර්තීන්ගේ ශෛලිය මෙහි පිටු කීපයෙන් මනාව පිළිබිඹු වේ. බුදුන් වහන්සේගේ ගුණ නොයෙකුත් උපමාවලින් යුතුව වනා ඉන් පසු නොයෙකුත් ජාතක කතා වලින් ද කරුණු ගෙනහැර දක්වා ඇත. ප්‍රකීර්ණක කාණ්ඩයෙන් අනතුරුව බොහෝ දීර්ඝ ලෙස ලෝක විවරණ කාණ්ඩය දැක්වෙයි. නොයෙකුත් දහම් කොටස් මෙහි විස්තර වෙයි....... බුදුන් වහන්සේගෙ ඇති නොයෙකුත් ගුණ උන්වහන්සේ කෙරෙහි භක්තියෙන් යෙදී පුන පුනා වර්ණනා කිරීමය කතුවරයාගේ පරමාර්ථය. "[1]

වික්‍රමසිංහ මහතාගේ මෙම ප්‍රකාශයෙන් කතුවරයාගේ අභිලාසය පිළිබඳ ඉඟියක් ලැබේ. කතුවරයා බුදුන් වහන්සේ කෙරෙහි උපන් භක්තියෙන් බුදු ගුණ නැවත නැවතත් වර්ණනා කරයි. ඒ වර්ණනාව අතරතුර ගැඹුරු දහම් කොටස් ද ඉදිරිපත් කොට ඇත. බුත්සරණෙහි එන ලෝක විවරණ කාණ්ඩය එයට නිදසුන්ය. සක්වල පිළිබඳව බුදුන් වහන්සේ විවිධ තැන්වල දේශනා කළ විවිධ විෂයික කරුණු කතුවරයා තම වර්ණනාවට එකතු කොට ඇත. බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය පිළිබඳ එහිදි යම් අවබෝධයක් පාඨකයා තුළ ජනිත කරවීමට උත්සාහ ගන්නා අතර තම විවිධ විෂයික දැනුමද කතුවරයා ප්‍රදර්ශනය කළේ විය.

"මේ ග්‍රන්ථය පරිච්ඡේද වශයෙන් සොළොසකට බෙදා දක්වා ඇත. එය නව අරහාදි බුදුගුණ අතුරින් අසූවල් ගුණය විස්තර කරනු සඳහා ලියනු ලදැයි ඉඳුරා කිව නොහැකිය.ඒ හැම ගුණයක් පිළිබඳවම ලියවුණු කොටස් එහි දැක්වෙන බැවිනි..... ඉන් පසු බුදුන්ගේ නොයෙක් විදියේ ඥානබල දක්වා ඥාන මණ්ඩලයට විෂය වූ විවිධ ලෝකයන්ගේ විවරණයක් දක්වනු ලැබේ...... බුදුගුණ අනන්ත වන බව කියන බුදුන්ගේ දේශනා විලාශයත් රූපකාය සම්පත්තියත් ධර්මකාය සම්පත්තියත් අනතුරුව විස්තර කරනු ලැබේ.... බුද්ධ ධර්මය පිළිබඳ අන් කිසිදු සිංහල ලේඛකයෙකුගේ දැනුමට නො දෙවෙනි දැනුමක් මොවුනට තිබුණු බව ග්‍රන්ථය පිරික්සීමෙන් වටහා ගත හැකි .......... බුත්සරණෙහි දැක්වෙන යම් හෝ ධර්ම කොට්ඨාස හෝ වෙන යම් පොතක හෝ පොත්වල දක්නට ලැබෙතත් මෙහි දැක්වෙන්නේ ස්වතන්ත්‍ර නිර්මාණ වශයෙනි." [2]

මෙම විචාරක මතයෙන් විද්‍යාචක්‍රවර්තීන්ට පරිවර්තන කෘතියක් කළේ යැයි දොස් නැඟීමේ සාධාරණ හේතුන් නැති බව ඒත්තු ගන්වයි.



වර්ණිත බුදු ගුණ අනුපිළිවෙළ කතාවක් නැති වුවද, ඒ හැම ගුණයක් තුළදීම විශේෂයෙන් ධර්මකාය සම්පත්ති වර්ණනාවට මූලිකත්වය දී ඇති බව පෙනේ.

කතුවරයා විටෙක සංස්කෘත මිශ්‍ර ගාඪ රීතියක් යොදා ගත්ත ද එය පරිවර්තන ස්වරූපයක් දරන්නේ යැයි ඇතැම් විචාරකයෝ කතුවරයාට දොස් නඟති. මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් එවැන්නෙකි. එහෙත් ආනන්ද කුලසූරිය මහතා ප්‍රකාශ කරන ආකාරයට එවැනි දෙයකින් කතුවරයාට දොස් නැඟීම උචිත නොවන්නේයැයි හඟවයි. බුදුන් වහන්සේ අවබෝධ කරගත් ඒ ධර්මයේ ගාම්භීරත්වය ප්‍රකාශ කරන්නට කතුවරයා විවිධ ගැඹුරු දහම් කොටස් ඉදිරිපත් කොට ඇත. විශ්වය පිළිබඳ බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මතාව කතුවරයා එහිදි විවරණය කොට ඇත. ත්‍රිපිටකය පුරා පැවැති ඒ ධර්ම කොටස් එකතු කොට කතුවරයා ඉදිරිපත් කළේ තත් වර්ණිත බුදු ගුණයෙහි තරම හෙළි පෙහෙළි කිරීමටය. වෙනත් ග්‍රන්ථ වලින් කතුවරයා තම ග්‍රන්ථයට ධර්ම කොටස් උපුටා ගත්ත ද ඒවා තම රචනා රීතියට අනුගතවන ආකාරයට කපා කොටා හැඩ දමා සකසා අතිශය වර්ණනාවකට ලක්කර ගත්තේය. විචිත්‍ර ධර්ම කථික හිමිනමක් විසින් ගැඹුරුව තිබූ බණ පදයක් උපමා කථායෙන් ඔදවත් කොට හරවත් කොට කියන්නා සේ විද්‍යාචක්‍රවර්තීන් බුද්ධ ධර්මය පිළිබඳව වර්ණනා කළේය.

"බුත්සරණ බුදු ගුණය කියන ගද්‍ය කාව්‍යයක් නොව බුදුගුණ නාමාවලියක් වැන්න. පිටුවකින් කිව හැකි අර්ථාවලියක් කෙටි වදනකින් කිව හැකි නම් එය උසස් කවිත්වයෙහි ලක්ෂණයකි...... නිර්මල ශ්‍රේෂ්ඨ ගද්‍ය කාව්‍යයක් වශයෙන් සලකතොත් බුත්සරණ පොදු ජනයාට ධර්මය ඉගැන්වීම බුදුන් ද, බුදු දහමද, කෙරෙහි ඔවුන්ගේ සැදැහැ බැති පෙම් වැඩීම..... එකල ගද්‍ය ග්‍රන්ථ සම්පාදනය කළවුන්ගේ මහත් අපේක්ෂාවක් විය. ඇතැම්හු බුත්සරණෙහි වාග් ප්‍රපංචය ව්‍යාජ වර්ණනයක් ද විස්තර කථා ද දකිති. සමහරු රමණීය වර්ණනයන් හා ව්‍යක්ත භාෂාව ද දකිති."[3]

මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ මෙම ප්‍රකාශය හුදෙක් යුග රීතිය පිළිබඳ අමතක කොට කළ ප්‍රකාශයකි.බුත්සරණ කතුවරයා යොදා ගත් රීතිය තත්කාලීන යුගයේ හින්දු දේව සංකල්පය ඔස්සේ සැකසුණු රීතියක් ලෙස සලකා එහි අගය කළ යුතු විශේෂත්වයක් නැති බව ඔහු නිගමනය කරයි. එම ප්‍රකාශය විද්‍යාචක්‍රවර්තීන් බුදුන් වහන්සේගේ

ධර්මකාය සම්පත්තිය ගැන අතිශයෝක්තියෙන් වර්ණනා කළ බව අවධාරණය කරයි. කෙටියෙන් කිවහැකි යම් ධර්ම කරුණක් කීමට කතුවරයා පිටු කීපයක් යොදා ගනියි.

තථාගතයන් වහන්සේ සියලු කෙලෙස් ප්‍රහීණ කොට ඒ කෙලෙසුන් නසාලන මග දක්වාලන ලද ධර්මකාය සම්පත්තිය පිළිබඳ විවිධ උගතුන් විවිධ නිර්වචන තුළින් විග්‍රහ කරන්නට ගත් උත්සාහය ඉහත කරුණු වලින් පෙනේ. ඒ කෙසේ වතුදු බුත්සරණ කතුවරයාට අවශය වූයේ විශ්වයේ පවත්නා සදාතනික සියලු ධර්මතාවන් බුදුන් වහන්සේගේ ප්‍රඥාවට ගෝචර වූ බව දැක්වීමටයි. බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියට විෂය නොවූ එකදු කරුණක් හෝ නැති තරම් දැක්වීම කතුවරයාගේ අභිප්‍රාය විය. තදභිප්‍රාය නිරතුරු සිත්හි දරාගත් කතුවරයා අවසථාව ලත් හැම විටම බුදුන් වහන්සේගේ එම ධර්මකාය සම්පත්තියෙහි තරම වර්ණනා කළේය.

"ප්‍රතීත්‍ය සමුප්පාදයෙහි පොවා, හේතු ප්‍රත්‍යාදි සූවිසි ප්‍රත්‍යයන්ද කෙරෙහි පොවා,රූපස්ඛන්ධාදි පඤ්ච ස්ඛන්ධයන් කෙරෙහි පොවා, දුක්ඛ සත්‍යාදි චතුරාර්ය සත්‍යයන් කෙරෙහි පොවා, චක්ඛායතනාදි දොළොස් ආයතනයන් කෙරෙහි පොවා, සති සම්බොජ්ඣංගාදි සප්ත විධ බොජ්ඣංගයන් කෙරෙහි පොවා, ශිල විසුද්ධි ආදි සප්ත විශුද්ධීන් කෙරෙහි පොවා......., නො මුළාවැ දහමින් දහම් තෝර තෝරා ශ්‍රී හස්තයෙහි රේඛා සේ පිරිසිඳැ දැන මෝහයෙන් දුරු වූ බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතුය."[4]

බුද්ධ ධර්මයේ අවබෝධ කළ යුතු ගැඹුරු දහම් කොටස් කීපයක්ම එකම ඡේදයක ගොනු කොට ඒ ධර්මයෙන් බුදුන් වහන්සේ අවබෝධ කරගත් ආකාරය එක්ම කෙටි නිදසුනකින් ඉදිරිපත් කොට ඇත. "ශ්‍රී හස්තයෙහි රේඛා සේ පිරිසිඳැ දැන" යන නිදසුන් පාඨය කතුවරයා ඉදිරිපත් කළේ බුදුන් වහන්සේගේ ඒ ප්‍රඥාවේ මහිමය වෙසෙසින් හුවා දැක්වීමටයි. හස්තරේඛා විමසීම පිළිබඳව අවබෝධය පහසුය. බුදුන් වහන්සේ ද එම ගැඹුරු වු ධර්මයන් අඩුවක් නැතුව මනාව අවබෝධ කරගත් සේක. යට දැක් වූ ඡේදය කතුවරයා සංස්කෘත පද බහුල රීතියකින් ලියා ඇත. සංස්කෘත මෙන්ම පාලි මූලාශ්‍ර සමීපයෙන් ගත් වර්ණනා මාර්ගයක් ලෙස ඒ වර්ණනා රීතිය හැඳින්වීමට පුළුවන.

බුදුන් වහන්සේ "සම්මා සම්බුද්ධ" වන ආකාරය පිළිබඳව වර්ණනා කරන කතුවරයා ගැඹුරු දහම් කොටස් ගැඹුරු භාෂා



උපයෝගිතාවකින් විග්‍රහ කරයි. ධර්මප්‍රදීපිකා කතුවරයා මෙන් විද්‍යාචක්‍රවර්තීන් ද බුදුන් වහන්සේ අවබෝධ කරගත් ඒ ගැඹුරු දහම ගැඹුරු භාෂාවකින් ලිවීමෙන් පැහැදිලි වන්නේ පාලි, සංස්කෘත භාෂාවලින් බණ පොත් පරිශීලය කර ඇති බවයි. ගැඹුරු දහම් කොටස් ගැන කියන විටෙක එවැනි භාෂාවක් යොදා ගත් කතුවරයා ඒ ධර්මයෙහි ආනිශංස ගැන කියන තැනකදි හුදු සරල භාෂා රීතියක් යොදා ගෙන තිබේ. පාඨකයාට විෂයවන ආකාරයෙන් ඒ ආනිසංස පැහැදිලි කිරීමත්, ගැඹුරු දහම ගැඹුරු පද ප්‍රයෝගයකින් පැහැදිලි කිරීමත් කතුවරයාගේ අභිප්‍රාය විය.

"මේ ධර්මයෝ මෙනෙහි කටයුත්තාහ. මේ ධර්මයෝ දුරු කොට යුත්තාහ. මේ ධර්මයෝ සතර අපායේ හෙළති. මේ ධර්මයෝ දිව්‍ය, බ්‍රහ්ම ලෝකයේ උපදවති. මේ ධර්මයෝ නිවන් සිටුවා මුත් නොහරති. අතීතයෙහිදු මේ ධර්මයෝ මෙසේමැයැ. අනාගතයෙහිදු මේ ධර්මය මෙසෙමැයි. මෙවැනි ගුණයක් ඇති සත්ව තෙමේ නිවී සැනසී මුත් නො නවත්ති."[5]

මේ අකාරයට ඉතා සරල බසකින් ධර්මකාය සම්පත්තියේ අගය කියාගෙන ගොස් අනතුරුව කතුවරයා ධර්ම කරනා කීපයක් ගැන ප්‍රකාශ කරයි. සීල, සමාධි, ප්‍රඥා, සතර සති පට්ඨාන, සප්ත ආර්ය, අෂ්ට විමෝක්ෂ හා එකළොස් වූ මෛත්‍රී අනුසස් යන කාරණා විස්තරයේ දි මූලාශ්‍ර සමීපව ආශ්‍රය කරගෙන ඇති බව පෙනේ. සංස්කෘත පද බහුල භාෂා රීතියක් යොදා ගෙන මුද්‍රිත පිටු 03කින් පමණ "සම්මා සම්බුද්ධ" ගුණය දක්වමින් එය අවසන් කරන්නේ මෙසේය.

"සියලු දත යුතු ධර්මයන් ගුරු කෙනෙකුන් නැතිව තමන්මැ නුවණින් පිරිසිඳැ මුළු සක්වලැ ගඳ කිළියෙහි සේමැ තමන් නුවණින් පිරිසිඳ දත්තා වූ බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු"[6]

බුදුන් වහන්සේ මුළු සක්වලම දත යතු සියලු ධර්මයන් ම සකාරනවම දැන ගත් සේක. ඒ සඳහා තමනට ගුරු වූ කෙනෙකුන් නැත. ගඳ කිළියේදි වැඩවුන් බුදුන් වහන්සේට එහි පිරිසිඳ ගත හැකි සේ එහි ම සිට මුළු සක්වලම අවබෝධය හා විමසීම ඇත්තේය. එබැවින් බුදුන් වහන්සේ " සම්මා සම්බුද්ධ" වන සේක.

කතුවරයා "ලෝකවිදූ" යන බුදුගුණය කියන්නට ආරම්භ කරන්නේ සංස්කාර ලෝකය පිළිබඳව පාලි ග්‍රන්ථයන්හි එන ඡේදයක් එලෙසින් ම යොදා ගනිමිනි.

" තවද එකෝ ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා තිස්සො වේදනා, චත්තාරො ලොකා චත්තාරො ආහාරා, පඤ්ච ලෝකා පඤ්චුපාදානක්ඛන්ධා,..... අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයොයි තමන් සේ වූ බුදු කෙනෙකුන් මුත් අනෙක් කෙනෙක් හට නො හැඟෙන සංස්කාර ලෝකය දත්තා වූ බුදුන් සරණ යෙමි."[7]

මෙලෙසින් ආරම්භ කරන ලෝකවිදූ බුදු ගුණය කියන්නට ගොස් කතුවරයා බුදුන් වහන්සේ සක්වල පිළිබඳ ලත් අවබෝධය කරුණු කිහිපයකින් ඉදිරිපත් කරයි. සප්ත ලෝක, චක්‍රාවාට, පෘථිවි, මහමෙර, සත්කුළපව්, සීදන්ත සාගරය, හිමාලය, නන්ද මූලක පර්වතය, අනවතප්ත විල, මන්දාකිනි විල, සක්වලැ හා සඳ හිරු තව්තිසා දෙව්ලොව, ඓරාවණ, ආසාවතී හා පරසතු රුක, අවීචිය. ලෝකාන්තරිකය, කල්ප බුද්ධක්ෂේත්‍රය, කල්ප විනාශය, ලෝකෝත්පත්තිය, ආදි කරුණු ගැන තොරතුරු ඉදිරිපත් කර ඇත. බුදුන් වහන්සේ අවබෝධයෙන් ලත් ඒ දැනුම ඇතිසේ යැයි කකතුවරයා අවසානයට ප්‍රකාශ කරයි.

බුදුන් වහන්සේගේ ශ්‍රී ධර්මකාය සම්පත්තියෙහි ශ්‍රේෂ්ඨත්වය පාඨකයාට කියන්නට විද්‍යාචක්‍රවර්ථීන් යොදා ගත් කථා ද අතිශයින් වැදගත්ය. නාලාගිරි දමන කථාවේදි කතුවරයා පියවරෙන් පියවර ඇතාගේ චණ්ඩ ස්වභාවය ප්‍රකට කරවන අතර පියවරෙන් පියවර බුදුන් වහන්සේගේ මෛත්‍රී ස්වභාවයද පාඨකයා තුළ නිරන්තර ඇති කරවමින් කරන වර්ණනාව ඉතාමත් රසවත්ය.

"අද මේ ඇත් තෙමේ මා සිටි මේ විථියෙහි කිහිඹියකට ද අන්තරායක් කෙළේ වී නම් මාගේ බුද්ධානුභාවයට නුසුදුසු යැයි සිතා වදාරා, අනන්තා පරිමාණ සක්වලැ සත්වයන් කෙරෙහි කරන්නා වූ මෛත්‍රිය මහ බිජුවකට මහමෙර පෙරළන්නා සේ එක ඇත්හු කෙරෙහි පතුරුවා, ඇසූ ඇසූ සත්වයන් මී බී මත්වූවන් සේ තමන් දිහාවට ගන්නා වූ මධුර ස්වර විහිදුවා තා මේ වීථියට හලුයේ අප නිසා මුත් තෙල කුමාරයා නිසා නොවන්නේ වෙද? මෙහි එවයි වදාළ සේක.



ඒ මිහිරි කටහඬ කනැ හෙත්මැ බැලූ ඇතු.... කනහුණු මිහිරි හඬින් ඇස හුණු බුදු රුවින් කේශර සිංහයක්හු දුටු ඇත් පොව්වෙකු සේ........"[8]

අනන්ත සක්වල සියලු සත්ත්වයන් කෙරෙහි බුදුන් වහන්සේ තුළ පැවැති අසාධාරණ වූ මෛත්‍රී ගුණයෙන් පිහිට නො ලැබ එකදු සත්ත්වයෙකු හෝ සොයා ගැනීම උගහටය. තමන් වෙනුවෙන් එකදු සත්ත්වයෙකුට අබටැක් තරමේ කරදරයක් නොවීමට වගබලාගත් බුදුන් වහන්සේ ඒසා සත්ත්වයන්ට පිහිට වීමට හැකි සෑම අවස්ථාවකදීම පිහිට වූ සේක. එය විටෙක උන්වහන්සේගේ ඍද්ධි ප්‍රාතිහාර්ය බලයෙන් හෝ රූපකාය සම්පත්තියෙන් ද විය. නාලාගිරි දමන කතාවේදි චණ්ඩ වු හස්ති රාජයා බුදුන් වහන්සේගේ මිහිරි කටහඬ කණ හෙත්ම චණ්ඩ ස්වභාවය අත්හැර මව සොයා කිරට එන ළදරුවෙකු සේ බවට පත් වී බුදුන් වහන්සේගේන් ධර්ම ශ්‍රවණය කරන්නේය. ධර්ම ශ්‍රවණය කිරීමෙන් දැමුණු සිත් ඇති මතැත්තෙම කේශර සිංහයක්හු දුටු ඇත් පොව්වෙකු සේ බවට පත් වී අමා බුදු රුවින් රූපශ්‍රී නම් මී බී සුරතල් වන ළදරුවෙකු තරම් වූයේ කවර නම් ගුණයක් සඳහා ද? ඒ මේ ගුණය කතුවරයා කියන ආකාරයයි.

"පන්සිල් රක්නා වූ කෙරෙහි ඇතුළත් කොටැ එදා පටන් පිනි බිඳක් සා රා පොදකුදු නො බොන පරිද්දෙන් කිහිඹියන් හා සතකු දූ නො මරණ පරිද්දෙන් හුදී දහම් ගන්වා එතැන්හි සිට බණ වදාරා සුවාසූ දහසක් සසර දුකින් මුදා"[9]

මිනිස් සත්ත්වයන් හා පමණක් නොව බුදුන් වහන්සේගෙන් බණ අසා වැඩ සාදා ගත් අනේක විධ සත්ත්වයෝ වූහ. නාලාගිරි දමන කථාවේදි කතුවරයා නාලාගිරි ඇතුගේ වික්‍රම බලන්නට ආ මිසදිටුවන්ගේ හා බුදුන් වහන්සේගේ වික්‍රම බලන්නට ආ බුදු සව්වන්ගේ චිත්ත සන්තානය තුළ උද්වේගය ඇති කොට එමගින් බුදුන් වහන්සේ ජයග්‍රහණය කළ අයුරු වර්ණනාවට ලක්කළා පමණක් නොව සුවිශාල වු සත්ත්ව ප්‍රමාණයකට වැඩ සැලසූ අයුරු ද ඉතා හර බරව වර්ණනා කොට ඇත. සුවාසූ දහසක් සත්ත්වයන් සංසාර නැමැති ඝොරබිරම් කතරින් එතෙර වීමට මෙහිදී අවස්ථාව සැලසූයේ බුදුන් වහන්සේගේ ධර්ම දේශනය නිසාවෙනි. තිරිසන් ගත සතෙකු අරමුණු කොට දේශනා කළ ධර්මයෙන් දෙව් බඹ මිනිස් ඈ අනේක විද සත්ත්වයන් වැඩ සලසා ගත් අයුරු එමගින් මනාව ධ්වනිත කොට

ඇත. එය හුදෙක් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි මහාත්මයය හා ශ්‍රේෂ්ඨත්වය හුවා දක්වන අවස්ථාවකි.

නාලාගිරි දමන කථාව හුදී බොදු ජනතාවගේ ශ්‍රද්ධා භක්තිය ජනිත කරවන්නා සේ ආලවක දමන කතාව ද ඒ හා සමාන රචනා රීතියකින් වර්ණිතය. බුදුන් වහන්සේගෙන් බණ අසා සිත පැහැදි තුනුරුවන් කෙරෙහි ගුණ ගායනා කරන ආලවකගේ මුවින් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය පිළිබඳව ඉතා රමණීය ප්‍රකාශයක් එළි දක්වන්නට කතුවරයා උත්සාහ දරා ඇත. එය සාර්ථක වූ වෑනුමක්ද විය.

"ආලවක තෙමේ ඒ අසා තමන් බුදුන් වදාරන බණ අසමින් සිතම අපායෙහි අකුල් හෙළා තබා අමාමහ නිවන් දැක සෝවාන් වූ හෙයින් පාපිට වැටිහි. අනෙක් කා විදාරමින් ද? ස්වාමීනි ඉඳුරාම සැක මැකී ගියේයැ. සැකයක් තියෙන නියායෙන් වදාළ බණක් ද? මට වන මහත් වැඩ පිණිස සැවැත් නුවර සිටැ මෙතෙක් කතර ගෙවා මාගේ විමානයට වැඩි නියාව මට දැන් හැඟුණේය."[10]

දෙපයින් අල්වා පරසක්වල ගසමියි කියූ ආලවක යක්ෂයා බුදුන් වහන්සේගේ ධර්ම ශ්‍රවණය කිරීමෙන් පසු පත් වූ තත්ත්වය කවරක් දැයි පාඨකයා හඳුනා ගන්නේ මුවගට නගා ගත් සාදු කාරයත් සමගය. උන්වහන්සේගේ ධර්ම දේශනා විලාශයේ සුවිශේෂී තත්ත්වයක් කතුවරයා අනාවරණය කොට ඇත. ''සැකයක් තියෙන නියායෙන් වදාළ බණක් ද?'' යනුවෙන් ආලවක යක්ෂයාගේ මුවඟට නැඟීමෙන් එමග ධ්වනිත කෙරෙයි. බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය දේශනා කරන විට පර්ෂද් මධ්‍යයේ වුවද ඒ ඒ පුද්ගලයාට විෂය වන අයුරින් ඒ ධර්මය පහදති. මේ බණ කියන්නේ මටය. මේ බණ කියන්නේ මගේ කුකුෂ බිඳීමටය. යන අදහස් ධම් සභා මණ්ඩපයේ සිටින්නවුන්ගේ සිත වදින තරමේ සමත් කමකින් උන්වහන්සේ ධර්ම දේශනා කරන සේක. එයයි බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි සුවිශේෂත්වය. ඒ ධර්මය දෙලොව සුව ගෙන දෙනු පමණක් නොව නිවන් මගද එළිපෙහෙළි කරන්නේය.

බුත්සරණ කතුවරයා බුදුරජාණන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය විවරණ කරන්නට විවිධ වූ භාෂා උපක්‍රම ද භාවිත කරගෙන ඇත. ගුණ වාචි පද යොදා ගෙන බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය වර්ණනා කළ අවස්ථා අතර ගංගා රෝහණ කථාව එවැන්නකි.



"මේ ආදි වු අනන්ත ගුණයෙන් සම්පූර්ණ වූ ශාඛ්‍ය සිංහ වූ දස බලධාරි වූ අනාවරණ ඤාණ ඇති චතුර්වෛශාරද්‍ය විශාර වූ අවීචියෙහි පටන් ගෙන භවාග්‍රය දක්වා භාවග්‍රයෙහි පටන් ගෙන අවීචිය දක්වා සියලු ලෝ වැස්සන් ගත්තා වූ "ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ'' කරුණාවෙන් ලෝකෝත්තර වූ ප්‍රඥාවෙන් අසාධාරණ වූ මෛත්‍රියට කුල දේවතා වූ ස්වාමි දරුවාණ කෙනෙක් ලෝකයෙහි ඉපිද වදාළ සේක".[11]

ඉහතින් දැක් වූ පාඨයේ අන්තර්ගත ධර්ම කරුණු විද්‍යාචක්‍රවර්ථීන් මුලින් වෙනත් විෂය කරුණු යටතේ විග්‍රහ කරන්නට යෙදුණු කරුණු වේ. එවැනි ගුණ නැවත නැවතත් වර්නා කරන්නේ කතුවරයා තුළ පැවති අපරිමිත භක්තිය නිසාය. "ප්‍රඥාවෙන් අසාධාරණ" වු යන එක්ම වැකියකින් කතුවරයා බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි ශ්‍රේෂ්ඨත්වය කියයි.

එමතු ද නොව තත් වර්ණනාවේදීම කතුවරයා බුදුන් වහන්සේ බෝධි සම්භාර ධර්මයන් පුරණ යුගයේදි පවා තමන්ගේ ධර්ම දේශනාවෙන් නොයෙකුත් සත්ත්වයන් දිවි ලත් අයුරු සිහිපත් කර දෙන්නේ එසේ වූ කළ බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය පිළිබඳ කවරක් කියමු ද? යන ප්‍රශ්නාර්ථයෙන් විය හැකියි.

''පෙර මේ සර්වඥයන් වහන්සේ බෝධිත්ත්ව භූමියෙහි සිට කළැ පවා ජම්බුද්වීපයෙහි එක්සිය රජ දරුවෝ ඔවුනගේ ධම් දේශනයෙන් පෙළඹි පූර්ණක නම් යක්ෂ සේනාධිපතීහු ඔවුන් හැර ගෙන ගිය කල්හි උන්ගේ විරහය. ක්ෂමා කොට ගත නොහී සත් දවසක් ඇතුළත අපගේ පණ්ඩිතයන් නුදුටුමෝ නම් ගිනි වැද මියම්හයි සැරසුනාහ. බෝධිසත්ව භූමියෙහි විදූර පණ්ඩිතව සිටියා වූ ස්වාමි දරුවාණන්ගේ ධර්මයෙහි රස දත් රජ දරුවන් පවා.....''[12]

ගංගා රෝහණ කථාවේදි කතුවරයා බුදුන් වහන්සේගේ බෝධි සත්ත්ව ආත්ම භාවයන් විවරණය කොට එමගින් ධර්මකාය සම්පත්තියෙහි පූර්ව වසනා ගුණය ඉස්මතු කොට දක්වා ඇත. බුදු වීමට මත්තෙන් පවා තමන්ගේ ධම් දේශනයෙන් නොයෙක් සතුන් දමන්නට හැකි වූ බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වීමෙන් ඒ ධර්මකාය සම්පත්තියෙන් කවරෙකුට පිහිට නොවන්නේ ද ? තම හෘද මාංශය උගුල්වා ගන්න ආ යක්ෂ සේනාධිපතිට ධර්මය කියා දී බෝසත් කල පෑ වික්‍රමයන් නොවන්නේ ද? එවැනි වූ කල බුදු බවට පත් කල්හි ධර්මයෙන් සතුන් සුවපත් නොකරන්නේ ද? යනාදි සිතුවිලි පාඨකයා

තුළ ජනිත කරවමින් බුදුන් වහන්සේගේ ධර්මකායයෙහි විපුලත්වය හුවා දක්වයි. ඉන් පසු රතන සූත්‍ර දේශනාවෙහි ආනිශංස ගැන කතුවරයා මෙසේ ප්‍රකාශ කරයි.

"ඒ සූත්‍ර දේශනා කොට අන්තයෙහි සුවාසූ දහසක් ප්‍රාණීන්ට අමෘත මහා නිර්වාණය සිද්ධ වන්නේය ඒ තුන් භය ද සංසිඳෙන්නේ යැයි "[13]

මුලින් රජ ඇමැත්තන්ගේ මුවට ෂට් ශාස්තෘන්ගේ ගුණ ගායනාවක් නංවා තදනන්තරව බුදුන් වහන්සේ හා උන්වහන්සේගේ ධර්මකාය සම්පත්තිය ගැන කියයි. තථාගතයන් වහන්සේ දේශනා කළ එකදු ධර්ම පදයකින් විශාලා නුවර තුන් බිය දුරු වී යන අයුරුත් එමගින් දසදහස් ගණන් සත්ත්වයන් සුවපත් වන අයුරුත් කීමෙන් කතුවරයා බලාපොරොත්තු වූයේ බුදුන් වහන්සේ අවබෝධ කරගෙන දේශනා කරන්නට යෙදුණු ඒ ශ්‍රී සද්ධර්මයේ අගය පෙන්වා දීමටයි.

"යුගන්ධර පර්වතය සේ අනන්තා පරිමාණ ගුණයෙන් විශිෂ්ට වූ සර්වඥතා ඥානය ලදින් මෝහ අන්ධකාරය විද්වංශනය කළහ..... මෙසේ සර්වඥයන් වහන්සේගේ අනන්තා පරිමාණ ගුණයන් සිහි කොට.... ගෙනැ යැ මා මේ පිරිත් බණන්නේ "[14]

ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මහ තෙරුන්ගේ මුවට එවැනි වදන් යෙදීමෙන් පෙනෙන්නේ ද ධර්මකාය සම්පත්තියෙහි විශිෂ්ටත්වය කීමට කතුවරයා ගත් උත්සාහයයි. අනඳ හිමියන්ගෙන් එවදන් දක්වා අනතුරුව එකම ගථා පාඨයක් දේශනා කිරීමෙන් එනුවරට අරක් ගත් යක්ෂයන් නුවර හැර ගිය ආකාරය විචිත්‍ර චිත්‍රයක් රේඛා ගත කරන්නා සේ දක්වයි. හිස් ලූලු අත දුවන යකුනට පවුරු දොරවල් ප්‍රමාණ නොවීය. අසුරයන් දිවෙන්නට වන් කල්හි සුරයෝ එ පුර බටහ. එකල්හි තුන් බියෙන් ඇළලී ගිය විශාලා මහනුවර සුරයන්ගෙන් ගහණ වූ තව්තිසා පුරයක් සේ රමණීය ස්වරූපයට පත් විය. ත්‍රිවිධ රත්නයේ ගුණ කදම්බය කියවෙන ඒ බුදු බණ පදයෙන් අනේ දහස් සතුන් සුවපත් වී ගියේය. තුන් බිය පහ විය. වැසි වැටෙන්නට වන. රෝග බිය සිඳින. වැසියෝ සුවපත් වූහ. වසර ගණනක් තුන් බියෙන් පීඩාවට පත් විශාලා නුවර ජනතාවට එකම බුදු බණ පදය අමා වැස්සක් තරම් විය. මේ කරුණින් බුදුන් වහන්සේ අපරිමාන ගුණ ඇතියෝ යැයි නොකියා පාඨකයාට සිතා ගන්නට තම රචනාව පෙළ ගස්වා ඇති ආකාරය ඉතා රසවත්වය. බණ මඩුවක හිඳ බුත්සරණ කියවන කල්හි මෙවැනි වැනුම් මගින් කියවෙන්නේ,ධ්වනිත වන්නේ ඒ උතුම් සද්ධර්මයේ උත්තරීතර



භාවය හා අද්විතීයත්වයයි. එවැනි හැඟුමක් පාඨකයා තුළ ජනිත කරවන සුළු වාග් ප්‍රපඤ්චයක් යොදා ගනිමින් විදු සක්විතීන් ධර්යේ උදාරත්වය හා ශ්‍රේෂ්ඨත්වය කියාපායි. කොතෙක් ඒ බණ පද කියුවද ඇති නොවන වර්ණනාවක් යැයි කතුවරයාට සිතෙන්නට ඇත.

"සත්ථා දේවමනුස්සානං" යන බුදු ගුණ වර්ණනා කරන්ට බට කතුවරයා බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි උදාරත්වය හුදු සරල භාෂා භාවිතයකින් මනාව ගෙනහැර දක්වා ඇත. අලංකාරාදි භාෂා ප්‍රයෝග ද යොදා ගනිමින් කතුවරයා එහිදි කරන වර්ණනාව බුද්ධ ධර්මයේ තරම කියාපෑමට තරම් ප්‍රමාණවත් ය. බුදුන් වහන්සේ දෙසූ එකදු බණ පදයක් එසේ නොවේ කියන්නට මුළු සක්වල එකදු සතෙක් සමත් කම් නොපාන අයුරු කතුවරයා දක්වන්නේ මෙසේය.

"මේ ධර්මය මේ ජාතියේ සුව එළවයි. මේ ධර්ම පර ජාතියෙහි සුව එළවයි. වදාළ කල්හි එසේ නො වෙයි කියන්නට මුළු ලොව ගොළුවන හෙයින් මුළු ලොව බැඳ දිව් වන හෙයින් තමන් වහන්සේ මේ ධර්මය අනවර්තයෙන් සේවනය කටයුතු යැයි වදාළ කල්හි මේ ධර්මය සේවනය කටයුතු නොවෙයි කියන්නට මුළු ලොව යන්ත්‍ර රූප සේ වත්, තමන් වහන්සේ මේ ධර්මය සේවනය නොකොට යුතු යැයි වදාළ කල්හි මේ ධර්මය සේවනය කටයුතුයැයි කියන්ට මුළු ලොව සෙලෙහි කල රූ සේ වත් තමන් වහන්සේ හීන යැයි වදාළ ධර්මය හීන නොවෙයි කියන්නට මුළු සත් ලොව අරූතෙලෙහි සතුන් සේ බස් නැතිවත්, තමන් වහන්සේ උත්තම යැයි වදාළ ධර්මය හීන යැයි කියන්නට මුළු ලොව අසංඥ තලයෙහි සතුනසේ දිවි සෙලැවිය නොහෙත්. ලොවට හිතාහිත යුක්තායුක්ත සේවනීය අසේවනීය සියලු ධර්මයන් සුදුසු පරිදිදෙන් දේශනා කරන්නට මාගේ ස්වාමීන් තබා අනික් සත්වයක්හු අසමර්ථ හෙයින් මෙලොවින් පරලොවින් වන අර්ථයෙන් සුදුසු පරිද්දෙන් සියලු සත්වයන්ට අවවාද කරන සේ දන්නා වූ බුදුන් සරණ යෙමි බුත්සරණ යා යුතු"[15]

බුදුන් වහන්සේ වදාළ බණක් එසේ නොවෙයි කියන්ට සක්වල සතුන් නො පොහොනා බැවින් උන්වහන්සේගේ ඒ ධර්ම සම්පත්තියෙහි හීනතාවක් නැත්තේය. "මුළු ලොව සෙලෙහි කළ රූ සේ වත් " යන උපමා පාඨ යොදා ගනිමින් කතුවරයා ප්‍රකාශ කරන්නේ එයයි. මුළු සක්වල වැසියන්ගෙන් එකදු සතෙක් බුදු බණ බොරු යැයි නොකියති. එමතුදු නොව මේ ධර්මය මේ අත්බැව් හි පමණක් සුව ගෙන දෙන ධර්මතාවක් නොවේ. එය පරලොවිහි ද සුව



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
02 OCT 2015

එළ වත්තේය. '' මාගේ ස්වාමීන් තබා'' වැනි පද තළින් කතුවරයා තම උපරිම භක්තියෙන් ගෞරවය පුද කරන බවක් දක්නට ඇත. එමතුද නොව බුදුන් වහන්සේ හා ධර්මය කෙරෙහි ශ්‍රෝතෘ ජනතාව තුළ නොමද ගෞරවය ජනිත කරවීමටද ප්‍රයත්න දරා ඇත.

සංසාර දුක්ඛයෙහි පිහිටි සියලු සතුනට එම දුක්ඛයෙන් ගැළවීමට ඇති එකම දේශනාව නම් බුද්ධ දේශනාවයි. එය බුදුන් වහන්සේ විසින් සේවනය කරන ලද ධර්මයයි. එම ධර්මයෙන් සංසාරගත සත්වයන්ට ඇති වන්නා වූ දුක් පීඩා දුරු කර ගත හැකි නොවන්නේ නොවේ යැයි කතුවරයා ප්‍රකාශ කරන අතර පාඨක ජනතාව එමගට ගෙන සද්ධර්මයෙහි පිහිටුවා ඒ ධර්මයේ තරම උගන්නවන්නට කියූ පාඩමක් ලෙස කර ඇති එම වර්ණනාවන්ගෙන් පෙනෙන්නේ කතුවරයා බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය පිළිබඳව වර්ණනයට ගත් උත්සාහයයි.

උපමා කාණ්ඩයෙහිදි විදුසක්විතීන් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය විවිධාකාරයෙන් උපමාවට නැගූ අයුරු දැක ගැනීමට පුලුවන.

"තවද නො සිහිල් නො පානා චන්ද්‍රකාන්ත මාණික්‍යයක් සේ නොමිහිරි දහම් රසයක් ම නො පවත්වන බුදුන් සරණ යෙමි''

"තවද ඇතුන් නො තතනවා නො පවත්වා කේශර සිංහ නාදයක් සේ ඇසූ තීර්ථකයන්ගේ මත් නො බිදෙන ධර්ම දේශනාවක් ම නො පැවැත් වූ.....''

"තවද බැලූ බැලූ කල සියලු තුන් ලොව වටහන් වැ පැණෙන සක්විති රුවන දැරූ වේපුල්ල පර්වතය සේ සියලු ඥෙය මණ්ඩලය පැනෙන්නා වූ සර්වඥ මහ රුවන නැමැති මැණික දැරූ''

''තවද බලුමස් විකපන්නා වූ චණ්ඩාල ග්‍රාමයක් සේ ධර්ම විපාක ලොවට සද්ධර්මය වැනි පවිත්‍ර දැයක් විකපත් කළා වූ''

''තවද රාග ද්වේශ මෝහ වැනි අනන්ත ජාතියෙහි පුරුදු ව ආ තුන් යහළුවන් උනුන් නොගෙන බැඳපියා හී පලන පරිද්දෙන් එක්සිත්වැ තර කොටැ බල දුන් බුදුන් සරණ යෙමි යි බුත්සරණ යා යුතු''[16]

ඉහත දැක් වූ උපමාවන්ගෙන් බුදුන් වහන්සේගේ ශ්‍රී ධර්මකාය සම්පත්තිය වර්ණනාවට ලක්කොට ඇත. කතුවරයා උපමා කාණ්ඩයෙහි දෙසීය අට පනසක් උපමා ඡේද යොදා ගෙන ඇත. එයින් බහුතරය



යොදා ගෙන ඇත්තේ බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි විශිෂ්ටත්වය දැක්වීමටයි. බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මයේ විශේෂත්වය දැක්වීමයි. බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මයේ විශිෂ්ටත්වය දක්වනවා පමණක් නොව එවැනි ධර්ම දේශනාවක් කරන්නට උන්වහන්සේ තුළ වූ ආධ්‍යාත්මික ගුණ ධර්මයන් ද එමගින් දක්වන්නට කතුවරයා උත්සුක වී ඇත. මෙවැනි උපමා මාලාවකින් කතුවරයා බුදුරදුන්ගේ ධර්මයෙහි විශිෂ්ටත්වය කියා පෑවේ ඒ සද්ධර්මයට තම පාඨක ජනයාද නතු කරන අටියෙනි. කුසගිනි ඇති වූ ළදරුවෙකු මව් ඇකයේ සිතූ සේ කිරි උරා බොන්නා සේ ද?, කතරක අතරමං ව සා පිපාසා ලද්දෙකු සිහිල් දිය කඩක් පරිහරණයට ලද්දා සේ ද? කුසගිනි ඇත්තෙකුට දිව බොජුන් ලැබුනා සේ ද?, විදුසක්විතීන් බුදු බණෙහි අගය පෙරළා පෙරළා වින්දනය කළේය. ලිය ලියා සතුටු වූයේ ය. නියං සමය නිමා කොට වසත් කල් පැමිණි කලක මෙන් තම පාඨක ජනයා බුදු බණෙහි තෘප්තිමත් කරන්නට නොගත් උත්සාහයක් නැති තරම්ය.

ඉහත දැක් වූ කරුණු විග්‍රහ කොට බලන කල්හි විදුසක්විතීන් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය වර්ණනා කිරීමට ක්‍රම කිහිපයක්ම යාදාගෙන ඇති බව පෙනේ. භක්තියත් ශ්‍රද්ධාවත් පාඨකයා තුළ ජනිත කරවිය හැකි ආකාරයෙන් තත් ක්‍රමෝපායන් යොදාගෙන තිබීම විදුසක්විතීන්ගේ රචනා තියරෙහි කැපී පෙණෙන ලක්ෂණයකි. ඒ අනුව,

01. එක් බුදු ගුණයක් වස්තු විෂය නො කරගනිමින් සියලු බුදු ගුණ වැනීම.
02. බුදු දහමේ ගැඹුරු දහම් ගැඹුරු භාෂා ප්‍රයෝගයකින් ඉදිරිපත් කිරීම.
03. කියූ ගුණ නැවත නැවතත් වර්ණනාවට හසුකර ගැනීම.
04. ගුණවාචී පද යොදා ගැනීම හා ගැඹුරු භාෂාවක් මෙන්ම විටෙක හුදු සරල භාෂාවක් යොදා ගැනීම.
05. ධර්ම දේශකයෙකුගේ මග අනුගමනය කිරීම.
06. ආලංකාරික ලක්ෂණ යොදා ගැනීම.
07. ශබ්ද රසය හා අර්ථ රසය උද්දීප්තව ධ්වනිත කිරීම.
08. සව්වන්ගේ මුවඟින් බුදු බණ වර්ණනාවට ලක් කිරීම.

ග්‍රන්ථ රචිත තදනුගත යුගයේ ඉස්මතුව ආ ඊශ්වර නිර්මාණවාදී සංකල්ප හා හින්දු දේවාදි සංකල්ප නිසා බෞද්ධ ජනතාව ඒ ඒ දහම් මග යන්නට උත්සුක වූහ. තෙරුවන් කෙරෙන් ඈත් වන්නට පටන් ගත් බෞද්ධ ජනතාවගේ සිත් සතන් තුළ ඒ තිසරණ ගුණ වර්ධනය කරවන්නට විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණෙහි විශේෂ වෙහෙසක් දරා ඇත්තාහ. ඒ අනුව බුදුන් වහන්සේගේ ධර්මය සක්වල සත්වයනට අසත්‍ය කළ නොහැකි බව තරයේ ඒත්තු ගන්වන්නට කතුවරයා විටෙක ගැඹුරු දහමක් විස්තර කරන අතර තවත් විටෙක සරල බණ දහමක් කියා දෙයි. එසේ කියා දී ඒ බණ මෙලොව පරලොව හිත සුව පිණිස පමණක් ම නොවන බවත් එහි අවසාන ප්‍රතිඵලය නිවන බවත් අගවන්නට කතුවරයා පසුබට නොවීය. ඒ සඳහා ඇවැසි සියලු රචනා රීතීන් බුත්සරණින් එළිදැක්වූයේ ද විය.

හුදී ජනතාව තුළ බුදු දහම කෙරෙහි ප්‍රසාද සංවේගයත් භක්තියත් ජනිත කරවන සුළු වර්ණනා මාර්ගයක් අනුගමනය කළ විදුසක්විතීන් එමගින් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියෙහි උදාරත්වය ශ්‍රේෂ්ඨත්වය හා විශිෂ්ටත්වය හා අසාධාරණත්වය පෙන්වා දුන්නේය. තත්කාලීන කතුවරයන් අතුරෙන් බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියේ තරම ලියූ වෙනත් එකදු ලේඛකයෙකු සොයා ගැනීමට නොහැකි වන සේ විදුසක්විතින් ඒ වර්ණනා නියර පෝෂණය කළේ යැයි පවසතොත් එය යුක්ති යුක්ත ය.



## ආන්තික සටහන්

1 වික්‍රමසිංහ, කේ.ඩී.පී. **සිංහල ලේඛක පරපුර**, 1964, ඇම්.ඩී. ගුණසේන සමාගම, පි.අ.120.

2 කුලසූරිය, ආනන්ද, **සිංහල සාහිත්‍යය I** , 1999, විසිදුණු ප්‍රකාශකයෝ, පි.අ. 189-191.

3 මාර්ටින්,වික්‍රමසිංහ, **සිංහල සාහිත්‍යයේ නැඟීම**, 1997, තිසර ප්‍රකාශකයෝ, පි.අ. 85-87.

4 **බුත්සරණ**, (සංස්) ඃ- ලබුගම, ලංකානන්ද හිමි,1964, ඇම්.ඩී. ගුණසේන සමාගම, පි.අ. 23-24.

5 එම, පි.අ. 27.

6 එම, පි.අ. 29.

7 එම, පි.අ.42

8 එම, පි.අ. 82-83.

9 එම, පි.අ. 84.

10 එම, පි.අ. 159.

11 එම, පි.අ. 159.

12 එම, පි.අ. 175- 176.

13 එම, පි.අ. 176.

14 එම, පි.අ. 182.

15 එම, පි.අ. 211.

16 ම, පි.අ. 289-290.